568

චක්‍රලේඛ අංක. 04/96

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
26-6-1996
[illegible]

මගේ අංකය:- 4/10/චක්‍රලේඛ,
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
අංක. 07, ග්‍රෙගරිපාර,
කොළඹ 07.
1996.06.21

සියළුම පළාත් ඉඩම් කොමසාරිස් වරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

රජයේ ඉඩම් ආඥා පණත යටතේ දීර්ඝකාලීන බදු
සඳහා නිර්දේශිත වාර්තා එවීම.

රජයේ ඉඩම් ආඥා පණත යටතේ දීර්ඝකාලීන බදු සඳහා නිර්දේශිත වාර්තා එවන විට අවශ්‍ය ලේඛන වල අඩුපාඩු නිසා එම කාර්යයන් ප්‍රමාද වන අවස්ථා හා තීරණ ගැනීමේදී ඇණහිටීම වන අවස්ථා දැක ගත හැකි වී ඇත.

02. එහෙයින් මින් ඉදිරියට දීර්ඝකාලීන බදු සඳහා ලිපි ලේඛන මා වෙත එවන විට පහත සඳහන් අවශ්‍යතා සියල්ල සහිතව එම වාර්තා එවීමට කටයුතු කරන්න.

02:1. බදු ඉල්ලුම්කරුගේ අයදුම්පත.

02:2 අදාල ආකෘතියේ වාර්තාව (ඉල්ලුම් පත්‍රය) ඉඩම් කාර්ය සංග්‍රහයේ 242 පිටුවේ සිට ඉදිරියට ඇති පරිශිෂ්ඨ වල මේ ආදර්ශ ඉල්ලුම්පත් ඇත.

02:3 කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් ලේකම් ගේ අංක 94/11 සහ 1994.12.19 දිනැති චක්‍රලේඛයේ සඳහන් ආකෘති පත්‍රයේ සකස් කල අදාල ඉඩම පිළිබඳ තත්ව වාර්තාව සහ ප්‍රාදේශීය ලේකම් ගේ සහතිකය.

02:4 කච්චේරි මිනින්දෝරු විසින් පිළියෙල කර ඇති ඉඩමේ අනුරේඛනය හෝ මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් පිළියෙල කර ඇති ඉඩමේ පිඹුර.

02:5 අදාල ආයතන වල එකඟතාවය:-
ඉඩම් නියෝග 207 (4) හි ( ඉඩම් කාර්ය සංග්‍රහයේ 213 පිටුව) හා 19 වන පරිශිෂ්ඨය යටතේ ( ඉඩම් කාර්ය සංග්‍රහයේ පිටුව 266) එම ආයතන විස්තර කර ඇත. උදාහරණ:- ඉස්සන් ව්‍යාපෘතියක් සම්බන්ධව නම් ධීවර අමාත්‍යාංශයේ අනුමැතිය. කර්මාන්ත ව්‍යාපෘතියක් නම් කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතිය ආදී ලෙසය. පරිසර බලපෑමක් සිදුවන සියළුම කර්මාන්ත හෝ ව්‍යාපෘති සඳහා පරිසර අධිකාරියේ අනුමැතිය හෝ අදාල නොවන බවට පරිසර අධිකාරියෙන් ලබාගත් ලිපියක් ඉදිරිපත් කිරීම අවශ්‍යය.

02:6 අවශ්‍ය අවස්ථා වලදී දිවුරුම් ප්‍රකාශය. මෙහි ආදර්ශයක් ඉඩම් කාර්ය සංග්‍රහයේ 262 පිටුවේ 17 වන පරිශිෂ්ඨයේ ඇත.

...02.

02:7. ඉඩම ලැබුණු ආකාරය:-

I. ටෙන්ඩර් ක්‍රමයට

II. වෙන්දේසියකින්

III. ඉඩම් කච්චේරියකින්

IV. පුවත් පත් දැන්වීමක් මගින් අයදුම් පත් කැඳවා තෝරා ගැනීමෙන්.

V. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතියෙන්.

VI. කැබිනට් මණ්ඩල අනුමැතියෙන්

VII. නීත්‍යානුකූල පැවරීමකින්

VIII. අනවසරයෙන්

IX. වෙනත්

ඉහත සඳහන් කුමන ආකාරයකට ඉඩම ලැබුනේද යන්න සඳහන් කළයුතු අතර, එය සනාථ කිරීමට අවශ්‍ය ලියවිලි ද අවශ්‍ය අවස්ථා වලදී අමුණා එවීම අවශ්‍යය. උදාහරණ ලෙස නීත්‍යානුකූල පැවරීමක් නම් එසේ පවරනු ලැබූ ලිපියේ ඡායා පිටපතක් එවිය යුතුය. විශේෂයෙන් අනවසර ඉඩම් සඳහා නිර්දේශිත වාර්තා එවන විට ඒ සඳහා නියමිත ආකෘතිය භාවිතා කළ යුතු අතර, ( ඉඩම් කාර්ය සංග්‍රහයේ 263 පිටුවේ ඇති 18 වන පරිශිෂ්ඨය) අනුග්‍රාහිකව එම ඉඩම දීමට හේතු ද අනිවාර්යයෙන්ම සඳහන් කර එවීම අවශ්‍යය. මේ සම්බන්ධව ඉඩම් කාර්ය සංග්‍රහයේ 205 පිටුවේ ඇති ඉඩම් නියෝග 199හි(2)(ඪ) කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

03. නිවාස සඳහා ඉඩම් අලුතෙන් ලබාදීමේදී කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් ලේකම්ගේ අංක. එල්2/5/42 හා 94.12.06 දිනැති අංක. 94/8 දරණ චක්‍රලේඛයේ සඳහන් ඉඩම් උපරිම සීමාවන් ගැනද සැලකිලිමත් විය යුතුය.

04. සමාගම් සඳහා ඉඩම් ඉල්ලුම් කරන අවස්ථා වලදී සමාගමේ ලියා පදිංචි කිරීමේ සහතිකයේ පිටපත හා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, ලිපිනයන් ද ඉදිරිපත් කළ යුතුය. ඉඩම් කාර්ය සංග්‍රහයේ 212 ඇති ඉඩම් නියෝග 207 හි (2) (X) බලන්න.

05. අදාල අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය හා ව්‍යාපෘති වාර්තාව ද කෘෂිකර්ම ව්‍යාපාර, ඉස්සන් ව්‍යාපෘති වැනි ව්‍යාපාර සම්බන්ධයෙන් ද ව්‍යාපෘති වාර්තාවක් එවීම අවශ්‍යය.

/....3

06. ඉහත ලියවිලි මේ කාර්යාලයට එවන විට ඔබේ හා පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශයන් ද ඇතුළත්ව එවීමට ද කටයුතු කරන්න.

07. දීර්ඝකාලීන බදුදීම් නිර්දේශ කිරීමේදී ජනාධිපති ලේකම්ගේ අංක. එස්.ර.අයි/ඒ/4/34 සහ 1995.07.12 දිනැති රජයේ ඉඩම් පවරා දීමේදී අනුගමනය කළයුතු මාර්ගෝපදේශ මාලාවේ 11 සහ 12 උපදෙස් ද සැලකිල්ලට ගත යුතුව ඇත. මේ අනුව රජයේ ඉඩම් ලබාදීම සඳහා ඉඩම් ලාභීන් තෝරා ගැනීමේ දී ඒ සඳහා සෑම අයෙකුටම ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදෙමින් පැහැදිලි හා විනිවිද පෙනෙන තෝරා ගැනීමේ ක්‍රමයක් අනුගමනය කළ යුතු බව දන්වා ඇත. මෙහිදී ටෙන්ඩර්/ප්‍රසිද්ධ වෙන්දේසි ක්‍රමය වඩාත් හොඳ බව පෙන්වා දී ඇත.

08. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ හෝ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ඇති ව්‍යාපෘති වලට ඉහළ ටෙන්ඩර්/වෙන්දේසි අවශ්‍යතාවය බල නොපාන අතර මින් ඉදිරියට දීර්ඝකාලීන බදු සඳහා ඔබේ නිර්දේශ ඉදිරිපත් කරන විට මෙම චක්‍රලේඛයේ 8 ඡේදයේ සඳහන් විධිවිධාන වලට අනුකූලව ඉඩම් ලාභීන් තෝරා ගෙන ඇති බවට ඔබ විසින් පෞද්ගලිකව සහතික විය යුතුය.

09. මෙම චක්‍රලේඛය ලද බව මා වෙත වාර්තා කරන්න.

(ඩබ්ලිව්.කේ.කේ. කුමාරසිරි)
ඉඩම් කොමසාරිස්.

ජය/14.
P.96/188